# අනුරාධපුර අවධිය තුළ දේශපාලන ක්ෂේත්‍රයට බල පෑ බෞද්ධාගමික බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

උල්පතගම අමිතරතන හිමි

**Abstract**

The objective of this research is to be examined on the influence of Buddhism towards the political domain in the Anuradhapura era. It is traced, basis on historical chronicle sources such as Dipawaṃsa, Mahāwaṃsa, and Vansatthappakāsinī. Anuradhapura city was designed while the Panḍukābhaya King, was ruling the Panduwasnuwara kingdom. The advent of the Buddhism was caused to the political affairs in progress. Due to the patronage of Empire Asoka who was the sponsor for "Third Buddhist Council" in India, Buddhism was illuminatedin this country. As a result of the link between Sri Lanka and the Empire Asoka was being maintained the Buddhism further under the great supervision of the chief monks and Arahants.

The Kingdom had been ruled with collaboratingthe Buddhist perspectives and ethics. Accordingly, the first prerequisite to be fulfilled to be a King was to embrace Buddhism. It can be an evidentto see that Buddhism was preserved with solemnly and integrity in the country endowed with the influence of Buddhism

for stages. It is visible in the Rājāvaliya that the Buddhist monk occupied a central position in creating great pious kings in history with the advent of Buddhism. It is clearly indicated that Buddhism greatly influenced toward the political domain and the discussionwill be on its impact on reign.

***Keyword:*** Anuradhapura, Buddhism, country, kingdom, political

## හැඳින්වීම

රජරට ශිෂ්ටාචාර සමයෙහි රාජ්‍ය පාලනය සඳහා බුදුදහමේ ආභාෂය කෙතරම් දුරට උපකාර වූයේ ද යන්න මෙහිදී සාකච්ඡාවට බඳුන් කෙරේ. මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟ මෙරට දැහැමි රාජ්‍ය පාලනයක් ගොඩනැඟීම සඳහා වට පිටාව සකස් වූ ආකාරය ඓතිහාසික තොරතුරු මගින් දැකගත හැකිය. ශ්‍රී ලංකාවට වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේගේ මූලික කාර්යය වූයේ රජුත් රටවැසියත් කෙතරම් දුරට බුද්ධිමත් ද යන්න ප්‍රථමයෙන් විමසා බැලිමය. ඒ බව මැනවින් විශද වන කරුණක් වන්නේ මහලු බවට පත්ව සිටි මුට සිව රජු මිය යන තෙක් බලා සිට තරුණ වියට පැමිණි දෙවන පෑතිස් කුමරු රාජ්‍ය පාලකයා බවට පත් වූ පසු පැමිණීමය. එසේ වීමට මූලික හේතුව වූයේ මහලු භාවයට පත් රජු සමඟ ධර්ම දූත කාර්යය මැනවින් සිදු කිරීමට අපහසු බැවිනි. එසේ පැමිණි උන් වහන්සේ දෙවන පෑතිස් රජු මූලික කොට ගෙන දැහැමි රාජ්‍යයක් ගොඩනැඟීම සඳහා අදාළ උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව අනුරාධපුර යුගයෙන් ඇරඹි රජරට ශිෂ්ටාචාරයේ බෞද්ධාගමික පූජනීය වස්තුව වන ශ්‍රී මහා බෝධීන් වහන්සේ භාරතයේ සිට මෙරටට වැඩමවා එය දිවි හිමියෙන් ආරක්ෂා කරමින් රාජ්‍ය සංකේතය ලෙස භාවිත කරන්නට විය. නමුත් පසු කාලය වන විට රාජධානි මාරු වීම පදනම් කොට ගෙන බෝධීන් වහන්සේ වෙනුවට දළදා වහන්සේ රාජ්‍යයේ සංකේතය බවට පත් කරගත් අතර එහි ප්‍රධාන අනුසාසකයා වූයේ භික්ෂූන් වහන්සේය. ඒ අනුව බෞද්ධ දර්ශනය තුළ උගන්වනු ලබන දැහැමි රාජ්‍ය පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු දස රාජ ධර්ම, දස සක්විති වත් මෙන් ම සප්ත අපරිහානීය ධර්ම දිවි හිමියෙන් ආරක්ෂා කිරීමට කැප වී සිටියහ. බුදු දහමේ ආභාසයෙන් පෝෂණය වූ රජු සහ රාජ්‍යය හැම විටම ධාර්මිෂ්ඨ එකක් විය යුතු බව ජනයා



අපේක්ෂා කළහ. ''රාජා භවතු ධම්මිකො'' යන පාඨයෙන් ඒ බව මනාව විශද වේ.

## පර්යේෂණ ගැටලුව.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය සඳහා බුදුදහමේ ආභාසය කෙතරම් දුරට බලපෑවේ ද යන්න විමසා බැලීම.

## පර්යේෂණ ක්‍රමවේදය.

මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදා ගැනීමට බලාපොරොත්තු වන්නේ සාහිත්‍යගත මූලාශ්‍රයන් මෙන් ම ශිලා ලේඛන සාධකයන්ය.

## සාකච්ඡාව.

ශ්‍රී ලංකාවේ මානව ජනාවාසකරණය පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේදී මහාවංසය ආදි වංසකතා සාහිත්‍යයට අනුව විජය රජු එහි මූලාරම්භකයා බව සඳහන් කොට තිබේ. නමුත් පුරාවිද්‍යාත්මක සාධක අනුව මෙරට මානව ජනාවාසකරනයේ ඉතිහාසය වසර එක් ලක්ෂ විසිපන්දහ දක්වා ඈතට දිවයන බව කරුණු සනාථ කොට තිබේ **(Deraniyagala 1992: 709)**. එමෙන් ම මානවයාගේ බිහිවීම හා මානව ක්‍රියාකාරකම් එකවර බිහි වූවක් නොවන බව බුදුරජාණන් වහන්සේ ලෝකයේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු දක්වමින් දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ තොරතුරු සඳහන් කොට තිබේ. මෙම සූත්‍රයේ දක්නට ලැබෙන තොරතුරු අනුව මානවයාගේ යහපැවැත්මට මෙන් ම රාජ්‍ය පාලනයේ දී ආගමික උපදෙස් පිළිපැදීම ධාර්මික රාජ්‍යයක් ගොඩනැගීමට අතිශය හේතු සාධක වන බවය (දීඝනිකාය, 2005: 156-157). ඒ අනුව බුදුදහමේ ආභාෂයෙන් ම රාජ්‍ය පරිපාලන ව්‍යූහය සකස් වූ ආකාරයක් මෙම සූත්‍රාගත කරුණු මගින් අනාවරණය වේ. රාජ්‍ය පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු යහපත් ගුණ ධර්ම ''රාජ ධම්ම'' යනුවෙන් පාලි - සිංහල ආකාරාදියේ දක්වා තිබේ (බුද්ධත්ත හිමි, 1998: 411). එමෙන් ම සිංහල බෞද්ධ ශබ්ද කෝෂයෙහි ''රාජ ධර්මය (සං රාජ ධර්ම) පුරාණ කාලයේ රජ කෙනෙකු දත යුතු දශවිධ ප්‍රජා පාලන ධර්ම දස රාජ ධර්මය'' නමින් පෙන්වාදී තිබේ (ලියනගේ, 2014: 1320). ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ ''රජ'' යන්නට

ලබා දී ඇති අර්ථය වන්නේ රටෙහි පවත්නා සියලු අංශයන්හි මෙන් ම රජමහ විහාරයේද මූලික දායකයා රටෙහි රජු වන බවය (සෝරත හිමි, 1999: 824). එමෙන් ම ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂයේ "King (King) Sovereing of a nation Person invested with Supreme authority Over a nation tribe or Country Prince ruler Playing Card having Picture of the king chief piece in the game of chess monarch kinglet kingliness king less kingly" **English – Sinhala Dictionary**, **1999 (588)**. මෙම අර්ථ කථන සියල්ල සම්පිණ්ඩනය කර බැලීමේදී බුදු දහමේ ඍජු දායකත්වය රාජ්‍ය පාලනය සඳහා ලැබී ඇති බව දැකගත හැකි වේ.

බුදු දහම මෙරටට සංක්‍රමණය වීමට ප්‍රථමයෙන් එනම් ප්‍රාග් මහින්ද යුගයෙහි රාජ්‍ය පාලනය සඳහා වෙනත් ආගමික සංකල්ප එකතු වී ඇති බව දක්නට ලැබේ. "ආර්යයන්ගේ පැමිණීමට පෙර ලංකාවේ විසූ යක්ෂ, රාක්ෂ, නාග ආදි ගෝත්‍රයන්ට අයත් වූවන්ගේ ආගමික විශ්වාස කොබඳු වී දැයි ස්ථිර ලෙස කිව නොහැකිය. ආදිම යුගයේ සෙසු සෑම මනුෂ්‍ය වර්ගයක් මෙන් මොවුන් ද තම මුතුන් මිත්තන්ට සහ පර්වත වෘක්ෂ ආදියට වැඳුම් පිදුම් කළ බවට පසු කාලයේ මෙරට දියුණු වී ගියේ විශ්වාස සහ පුද පූජා සාක්ෂ්‍ය දරයි. බුදුසමය පැමිණීමට පෙර සිංහලයන් විවිධ පූජාවන්හි ඇලී වාසය කළ බව සත්වන ශතවර්ෂයට අයත් හියුංත්සාංගේ දේශාටන වාර්තාවෙහි සඳහන් වේ (**සුරවීර, 2010: 22-23**). විජයගේ සහ සත් සියයක් පිරිවර ජනයාගේ ආගම කුමක් වී දැයි කිව නොහැකිය. බෞද්ධාගම ද බ්‍රාහ්මණ සමය සහ නිගණ්ඨනාථපුත්ත විසින් දේශනා ලද ජෛනාගමය ඇතුළු මක්ඛලිගෝසාල, පූර්ණකස්සප, පකුධකච්චායන, සඤ්ජය බෙල්ලට්ඨිපුත්ත, අජිත කේසකම්බල ආදි නායකයන් දේශනා කළ දෙසැටක් මිථ්‍යා ලබ්ධි ද, විජය ලංකාවට පැමිණෙනවිට එනම් ක්‍රිස්තු පූර්ව පස්වන ශතවර්ෂයේදී ඉන්දියාවේ පැතිර තිබුණේය. සම්බුද්ධ පරිනිර්වාණ දිනයේදි හෝ එයට ආසන්න දිනයකදි ලංකාවට පැමිණි විජය ඇතුළු පිරිස එකල ඉන්දියාවේ පැවැති මේ ලබ්ධීන් ගැන කිසිවක් නොදැන සිටීමට කිසිඳු හේතුවක් නැත. එහෙත් ලංකාවට අලුතින් පැමිණි ආර්ය ජනයාට මුහුණ පාන්නට සිදු වූ අවස්ථාවන් දෙස බලන විට ආගමික ඇදහිලි හා විශ්වාසයන් කෙරෙහි සිත් යොමු කිරීමට ඔවුනට අවසරයක් නොලැබෙන්නට ඇතැයි සිතිය හැකි තරම්ය. යක්ෂ, රාක්ෂ, නාග ආදි අනාර්යයන්ගෙන් ආරක්ෂා වීම අලුතින් ජනාවාස



කරගත් ප්‍රදේශ පදිංචියට සුදුසු ලෙස සකස් කර ගැනීම ආදි කටයුතු රාශියක් සඳහා ඔවුන්ගේ කාලය සම්පූර්ණයෙන් ම වාගේ යොදන ලද්දේ විය (**සුරවීර, 2010: 23**). මෙහි දක්වන ලද තොරතුරුවලට අනුව විජය රජු තම පාලන කාර්යයයේදී බුදුදහමේ ආභාසය යොදගත් බවක් දැකගත නොහැකිය. එමෙන් ම වංසකතාවන්හි සඳහන්වන තොරතුරු අනුව රජු විසින් තම පාලන තන්ත්‍රය ගෙනයෑමට තමා වටා සිටි අමාත්‍යවරුන්ගේ උපදෙස් ලබාගැනීම සිදු කොට තිබේ. එම අමාත්‍ය මණ්ඩලය ද ඉන්දියාවේ සිට මෙරටට පැමිණි බ්‍රාහ්මණ වංශිකයන්ය.

අනුරාධපුරයේ ජනපදයක් පිහිටුවීම සිංහල ජාතියේ පියා හැටියට සැලකෙන විජයගේ කාලය දක්වා පැරණිය. විජය කුමාරයා හත්සියයක් පිරිවර සමඟ ලංකාවට ගොඩබැසි බව අපේ පුරාවෘතයෝ පවසත් අද මල්වතු ඔය නමින් හැඳින්වෙන කාදම්බ නදිය අසල විජයගේ ඇමතියෙකු විසින් අනුරාධගාම නමින් ගමක් ගොඩනැගූ බව සඳහන් වේ. විජයගෙන් පසු අවුරුදු තිස් නවයක් ගෙවී ගොස් සිංහාසනාරූඪ වූ පණ්ඩුවාස දේව රජු දවස ඔහුගේ මස්සිනා වූ අනුරාධ නම් කුමාරයෙක් එහිම ජනපදයක් ඇති කළ බව දැක්වේ. ඔහු එහි වැවක් බඳවා ඊට දකුණු දිගින් මාළිගාවක් තනවා එහි විසීය. ඔහුගේ බෑණාවූ පණ්ඩුකාභය රජකම අත්කර ගැනීම නිසා මාළිගයද ඔහුටම පවරා දුන්නේය. පුරයක් ගොඩනැගීමට අදහස් කළ පණ්ඩුකාභය සිරිත් පරිදි නක්ෂත්‍රඥයකුගේ උපදෙස් පරිදි අනුරාධපුර නම් නගරය තිම කළේය. ඊට මෙනම් වූයේ අනුරාධ නමින් දෙදෙනෙක් මෙහි විසූ නිසාත් අනුරාධ නම් නක්ෂත්‍රයෝගයෙන් නගරය සෑදූ නිසාත් යැයි විශ්වාස කරනු ලබයි (**මහාවංසය, 1984: 50-51**).

පණ්ඩුකාභය රජතුමාගේ මෞලි මංගල්‍යයේ දී අභිෂේකය සිදු කරන ලද්දේ වැවකින් ගත් දියෙනි. ශ්වේත ඡත්‍රයද එහි දියෙන් නාවා ගන්නා ලදි (**මහාවංසය, 1984: 50-51**). පසු කාලයේ දී මේ වැව විශාල කොට ඊට ජයවාපි යයි නම් තැබීය. නගර සකස් කිරීම සම්බන්ධයෙන් මහාවංශයේ ද තොරතුරු දැක්වෙයි. "දොරගම සතරද අබා වැවද ඒසේම මහත් සොහොන් භූමිය හා දම් ගෙඩිය හෝ වධ ස්ථානයද බටහිර රැජිණ ද දෙවොල ද වෙසමුණියා (දොවොල) දවැදි දෙවියා තල් (දෙවොලද) සහාය වස්තුවද ප්‍රභේද ගෙයද යන මෙතෙක් දෑ බටහිර දොර දිසා භාගයෙහි ඒ රජතෙමේ ම පිහිට වීය. නගර ශෝධක පන්සියයක් සැඩොල් මිනිසුන්ද කසළ ශෝධක දෙසියක් සැඩොල්

පුරුෂයන්ද මළ මිනී බැහැර ගෙනයන්නවුන් එකසිය පණහක් ද සොහොන් ගොවි සැඩොලුන්ද සොහොනින් වයඹ දිග උන්ගේ ගම් පිහිටු විය. ඒ මිනිසුන් විවිධ වූ පරිද්දෙන් ඒ කර්මාන්තයන් කලාහුය. ඒ සැඩොල් ගමට ඊසාණ දෙසින් සුසාන යයි නම්ලත් සැඩොලුන්ගේ සොහොනද කරවිය. ඒ සොහොනින් උතුරු දිග පහන් පව් අතර වැද්දන්ගේ ගෙවල් පෙළ පිහිටුවන ලද්දේ විය. ඊට උතුරු දෙසින් ගැමුණු වැව දක්වා නොයෙක් තවුසන්ගේ අසපුවක් කරන ලද්දේ විය. එම සොහොනට පෙර දිග රජ තෙමේද නා නා පාණ්ඩයෝද බොහෝ ශ්‍රමණයෝද විය. එසේම රජතෙමේ කුම්භණ්ඩ නම් නිගණ්ඨයා පිණිස දෙවොලක් කරවීය. ඒ දෙවොල එනම් විය. එයින් බටහිර භාගයෙහි ව්‍යාධපාලියෙන් පෙරදිග මිත්‍යාදෘෂ්ඨි කුල පන්සියක් විසූහ. එසේම ඒ රජතෙමේ ජෝතිය ගෙයින් ඔබ ගැමුණු වැවින් මොබ පරිබ්‍රාජකාරාමයක්ද කරවිය. ආජීවකයන්ට ගෙයක්ද බමුණන්ට ආධාර ගෙයක්ද සිවිගෙයක් හා ආශීර්වාද ශාලාවක්ද ඒ ඒ තැන කරවිය (මහාවංසය, 1984: 51). මෙසේ අනුරාධපුරය ක්‍රමයෙන් නාගරික සංස්කෘතියක් කරා ගමන් කිරීමට අවශ්‍ය අඩිතාලම දැමීම පණ්ඩුකාභය රජු විසින් සිදු කරන ලද බව දැකගත හැකි වේ. මහාවංසයේ දක්වන ලද මෙම තොරතුරු අනුව එවකට පැවැති ආගමික නායකයන් හට ආරාම සැලසුම් කරණය ද සිදු කොට ඇති බව දක්නට ලැබේ. මෙම කාල පරිච්ඡේදය වන විට ද ඔවුන්ගේ අවවාද අනුශාසනා රාජ්‍ය පාලනය සඳහා ඍජුව හෝ වක්‍රව ලැබෙන්නට ඇති බව සිතිය හැකිය. පුරාණ අනුරාධපුර නගරයේ මහාශාක්‍ය වූද දර්ශනීය වූද ගොඩනැගිලි සියල්ලම ආගමික කටයුතු උදෙසා පිහිටුවන ලද ඒවා ය.

ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් රාජ්‍යත්වයට පත්වූයේ දේවානම් පියතිස්ස රජතුමා ය. ඒ බව මහාවංස ටීකාවේ විස්තරාත්මකව සඳහන් කොට තිබේ (මහාවංස ටීකාව, 2001: සං). ජනනායකයෙක් වශයෙන් රජුට හිමි වැදගත්කම බෞද්ධ සම්ප්‍රදායෙහි බෙහෙවින් අවධාරණය කෙරිණි. තිස්ස රජතුමන් දෙවනවර අභිෂේකයට පත් වූයේ අශෝක අධිරාජ්‍යාගේ ඇරයුමෙනි. නමුත් ඊට ප්‍රථම ඔහු සාමාන්‍ය රජෙකු ලෙස සිය කටයුතු සිදු කළ බව මෙමගින් ගම්‍යමාන වේ. ඉන් පසුව භාරතයන් සමඟ පැවති රාජ්‍ය සම්බන්ධතා හේතු කොට ගෙන අශෝක රජුගේ සහාය ඇතිව උසස් තත්ත්වයකට පත්විය. එම තත්ත්වය ආරක්ෂා කොටගෙන මහා රාජ්‍ය තත්ත්වයෙන් කටයුතු කළ



බව මිහින්තලා සෙල්ලිපි පාඨයෙන් අනාවරණය වේ. "දෙවන පිය පිය තිස මහරඣ" දෙවියන්ට ප්‍රිය වූ දේවානම් පියතිස්ස මහරජු යනුවෙනි (ලගමුව, 2009: 146).

අශෝක රජු බුදුරජාණන් වහන්සේගේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් ශතවර්ෂ දෙකකට පසු රාජ්‍යත්වයට පත්වූ අතර එතැන් පටන් බෞද්ධාගම රාජ්‍ය ආගම බවට පත් කරන ලදි (ඥානවිමල හිමි, 2000: 1). ඒ බව එතුමන්ගේ අණ පරිදි ධර්ම මහාමාත්‍යවරුන් විසින් සකස් කරන ලද ශිලා ලේඛන මගින් අනාවරණය වේ. එමෙන්ම ක්‍රි:පූ: 03 වන සියවසේ තිස්ස රජු රාජ්‍යත්වයට පත්වීමෙන් පසු රාජ්‍ය ආගම බවට පත් කරන කළේද බුදුදහමයි. දේවානම් පියතිස්ස රජු බුදුරජාණන් වහන්සේගේ අවවාදයට අනුව ම සීමා බන්ධනය සිදු කරන ලෙස මිහිඳු හිමියන්ගෙන් ආයාචනා කරන ලදි. බුදුරජාණන් වහන්සේගේ අවවාදයට අනුවම රාජ්‍ය විචාරීම 3 වන සියවසින් ආරම්භව 19 වන සියවස දක්වා අඛණ්ඩව පැවති බව දක්නට ලැබේ. ඒ බව මිහින්තලා ලෙන් ලිපි අංක 13 හි ''ගමණි ධමරඣ පුතශ අය අශලිශ ලෙණෙ''යනුවෙන් පැහැදිලි වේ (ලගමුව, 2009: 62). ධර්ම රාජ හා උපාසක නාමයෙන් හැඳින්විය හැක්කේ ධාර්මික පාලකයෙකුට පමණි. බුදුදහමට අනුව සමාජ, දේශපාලනික, සංස්කෘතික සෑම අංශයක්ම පවත්වාගෙන යාමට රජතුමා උත්සහ දැරීය. බුදු සමය හා රාජ්‍ය පාලකයා අතර අන්‍යෝන්‍ය සම්බන්ධය ක්‍රමයෙන් වර්ධනය විය. ඒ හේතුවෙන් බුදු සමය රාජ්‍ය නීතිය බවට පත් වූ අතර ධර්මයෙන් ඈත් වූවන් රාජ්‍ය ද්‍රෝහයන් ලෙස සලකන්නට විය. මේ නිසාම ලංකා රාජ්‍යයට හිමිකම් කීමට නීතියෙන් බලය ලැබුණේ බෞද්ධයෙකුට පමණි (චන්ද්‍රසිරි හිමි, 2007: 10).

''විජය රාජ කුමාරයන් කෙරෙ පටන් ලක්දිව හිමි කාලිංග වංශයෙහි රාජ දරුවන්ටයැ'' (කරුණාරත්න, 2000: 61). සඳහන් වීමෙන් ලංකාව බුද්ධ ධර්මය සතුබවත් එබැවින් චෝළ කේරළ ආදී අබෞද්ධයන්ට ලංකා රාජ්‍යයට හිමිකමක් නැති බවත් කීර්ති ශ්‍රී නිශ්ශංක මල්ල රජු සඳහන් කොට ඇත (කරුණාරත්න, 2000: 61). මෙම අදහසට වඩාත් ව්‍යක්ත ලෙස හා අවධාරණයෙන් මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර ස්වාමීන් වහන්සේ පූජාවලියෙහි සඳහන් කරති. රාජ්‍යත්වයට පත්වන්නා බෞද්ධයෙකු පමණක් නොව බෝධිසත්වයෙකු ද වීම අනිවාර්ය විය. හතරවන මිහිඳු රජුගේ අභයගිරි අංක 02 පුවරු ලිපියේ "සිරි ල(ක්හි)

නොබොසත්හු නො රජ්වන්හයි සැහැකල කොත් සවැනියමුනිර්ජ්හු...." **(කරුණාරත්න, 2000: 61).** යනුවෙන් සඳහන් කොට තිබේ. මෙම සඳහනට අනුව ලක්දිව රජ තනතුර ලබන්නේ බෝධිසත්වයෝය යන විශ්වාසයට අනුව රාජ්‍යභාවය ක්‍රමයෙන් විකාශනය වූ අයුරු පැහැදිලි වේ. මෙම පුවරු ලිපියේ ම සඳහන් අයුරින් රාජ්‍යත්වයට පත්වීමේ අරමුණු කිපයකි.

1. බුදු සසුන රැකීම
2. මහා සංඝයාට සේවය කිරීම
3. පාත්‍රසිවුරු රැකීම

ක්‍රි:ව: 1198 රාජ්‍ය ප්‍රාප්ත නිශ්ශංක මල්ල රජතුමා 12 වැනි සියවසේ පිහිට වූ ප්‍රීතිදානක මණ්ඩප ශිලා ලිපියෙහි ......... මව් පියන් සේ ලෝ සසුන් රක්නා බෝධිසත්වරයෙකුම බව ඉදිරිපත් කර ඇත.ක්‍රිස්තු වර්ෂ 1236 - 1271 අතර කාලයේ රාජ්‍යත්වයට පත් දෙවන පරාක්‍රමබාහු රජතුමා ''මම බුදු වෙමි'' යනුවෙන් කළ ප්‍රාර්ථනය තුළින්ද ඉහත අදහසම ගම්‍යමාන වෙයි. ක්‍රි:පූ: අවධියේ සිට ශතවර්ෂ කීපයක් ම රජතුමා සාමාන්‍ය මිනිසෙකු ලෙස සැලකිණි. එහෙත් පසු කාලීනව රාජ්‍යත්ව සංකල්පය ක්‍රමයෙන් වෙනස් විය. ඇතැම් සංකල්ප අභාවයට ගිය අතර සමහර සංකල්ප ඉදිරියට පවත්වාගෙන යමින් නව සංකල්පද ඉදිරිපත් කෙරිණි. අනුරාධපුර අග භාගයේදී ආරම්භ වූ බෝධිසත්ව රාජ්‍යත්ව සංකල්පය පොළොන්නරු, දඹදෙණි, ගම්පොළ, කෝට්ටේ වැනි අවධිය දක්වාද ආරක්‍ෂා වෙමින් සංවර්ධනය විය **(චන්දසිරි හිමි, 2007: 10).**

පැරණි ශ්‍රී ලංකාවේ නීතිය වූයේ චාරිත්‍ර හා සම්ප්‍රදායන් රාජ්‍යත්වය හා බැඳුණු සියලු කටයුතු තීරණය වීම කෙරෙහි ද බලපෑ චාරිත්‍රයන්ය. මුල් කාලයේදී ශ්‍රී ලංකාවේ පැවතියේ ජනයා අතර සම්මත චාරිත්‍ර විධි පදනම් කරගත් ජන සම්මත පාලන ක්‍රමයකි. සමස්ථ පාලන ව්‍යුහයේම කේන්ද්‍රය වූයේ ද රාජ්‍ය රජුගේ මනා පැවැත්ම හා යහපත් චාරිත්‍රමත පාලනයේ සුඛනම්‍ය බවයි. සම්ප්‍රදායානුකූලව රාජ්‍ය ලබා ගැනීම සඳහා රජෙකු විසින් සපුරාලිය යුතු කොන්දේසි කීපයක් විය. මෙකී කොන්දේසි එකිනෙක ගෙන අවධානයට ලක් කිරීම වැදගත් වේ. ලක්දිව සිංහාසනය දැරීමට නම් රජකෙනෙකු විසින් සපුරාලිය යුතු මූලික කොන්දේසියක් වූයේ රජු බෞද්ධයෙකු වීමයි. ලක්දිව බෞද්ධ



සාසනය ආරම්භ වූ ක්‍රි:පූ: තෙවැනි සියවසේ සිට සිංහල රාජ්‍යයේ අවසානය වූ දහනවවැනි සියවස දක්වා වූ අති දීර්ඝ කාලයේ සිංහල සිංහාසනයෙහි නිත්‍යානුකූල අයිතිය සිංහල බෞද්ධයෙකුටම මිස වෙන කිසිවෙකුටත් හිමි නොවන බැව් සිංහලයන්ගේ පිළිගැනීමයි. ශ්‍රී ලංකාව බුද්ධාගම සමඟ වූ විශේෂ සබඳතාවයකින් ආශිර්වාදය ලද දේශයක් යන විශ්වාසය දීපවංස මහාවංස වැනි දිවයිනේ ආදීතම වංසකතාවල එන පුරාවෘත්ත මගින් හෙළිවේ. ලංකා සිහසුන ඇතැම් අවස්ථාවලදී බලයෙන් අත් කර ගත් දෙමළ රජුන් පවා සිංහල බෞද්ධයන්ගේ පක්‍ෂපාතිත්වය ලබා ගැනීම සඳහා ම බෞද්ධයන් ලෙස ක්‍රියා කළ බව ඇතැම් කරුණුවලින් හෙළි වේ. පස්වෙනි සියවසේදී ලක්දිව රජ කළ බුද්ද පාරින්ද නම් දෙමළ රජ කෙනෙකුට (ක්‍රි:ව: 437-452) අයත් සෙල්ලිපියක ඔහුගේ නමට මුලින් බුද්ධදාස යන නම විශේෂයෙන් යොදා තිබීමෙන් ඔහු බෞද්ධයෙකු ලෙස පෙනී සිටි බව නිසැකවම ඔප්පු වේ **(මෙන්දිස්, 2550: 751).** එකී සෙල්ලිපියේ ඔහු දමිළයෙකු බවද ස්ථිරව ම කිවහැක්කේය. එහි ඔහු පිළිබඳව සඳහන් වන්නේ බුදදළ පරිදේව යනුවෙනි (මෙන්දිස්, 2550: 751). මෙන්දිස් පවසන අන්දමට මේ වකවානුවේ සිටි රජවරු සාමාන්‍ය මිනිසුන් වශයෙන් නොව බෝධිසත්වයන් ලෙස සැලකුණු බවයි. සෞභාග්‍යයෙන් හෙබි ලංකාවේ රාජ්‍ය පද ප්‍රාප්ත වියයුත්තේ බෝධිසත්වවරුන් ම යැයි සඳහන් කරන හතරවැනි මහින්දගේ ජේතවනාරාම ටැම් ලිපියේ මේ මතය සනාථ කරන බවය **(මෙන්දිස්, 2550: 751).** මෙම අදහසට අනුව කියැවෙන තවත් කරුණක් වන්නේ රජකම ලබා ගැනීමද මහා සංඝයා වෙතින් ම කළ යුත්තක් බවත් එහිදී බුදු සසුන ආරක්‍ෂා කිරීම වැදගත් බවත්ය.

දුටුගැමුණු රජතුමා එළාර රජු සමඟ යුද්ධ කිරීමට ප්‍රථමයෙන් සඳහන් කරන ලද්දේ මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප විඳීම පිණිස නොව සම්බුද්ධ සාසනය ආරක්ෂා කර ගැනීම යන පාඨය ප්‍රකාශ කිරීමෙන් ම පැහැදිලි වන්නේ බුදු දහමේ ආභාෂය කෙතරම් දුරට රජුගේ ජීවිතයට සමීප වී තිබුණා ද යන්නය. එමෙන් ම තමා සමඟ සටන් කළ සතුරා වෙනුවෙන් දා ගැබක් නිර්මාණය කිරීම හා ඔහුට ගෞරව කිරීම සඳහා අවකාශය සලසා දීම බෞද්ධ දර්ශනයේ උගන්වනු ලබන විශිෂ්ට ගුණයක් ලෙස පෙන්වාදිය හැකිය. දුටුගැමුණු රජු රාජ්‍යත්වයට පත් වීමෙන් පසු සිදු කෙරුණු මුල්ම කාර්යය වූයේ

ද බුදු දහමේ සංවර්ධනය සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමය. ඒ අනුව මෙම යුගය බෞද්ධ ඉතිහාසයේ කැපී පෙනෙන යුගයක් ලෙස හඳුනාගත හැකිය.

සිංහල රජවරුන්ගේ කාර්ය භාර්යන්අතර බුද්ධ සාසනයේ චිරස්ථිතිය සඳහා මෙන්ම එහි ආරක්‍ෂාව සඳහා ද කටයුතු කිරීම ප්‍රධාන කාර්යයක් වූ හෙයින් රාජ්‍ය පදවියට බෞද්ධයෙකු තෝරා ගැනීම අතිශය වැදගත් විය. රජ කෙනෙකු ශ්‍රේෂ්ඨ වූ කිරුළ දරන්නේ බුද්ධ සාසනයේ ආරක්‍ෂාව සඳහා බව වේලෛක්කාර ලිපියේ දැක්වේ (මෙන්දිස්, 2550: 751). රජෙකු දෙමව්පියන් මෙන් මුළු ලෝකයක් ශාසනයත් ආරක්‍ෂා කරන්නෙකු වශයෙන් ද සලකන ලදි. මේ හෙයින් රටේ සෞභාග්‍යයත් ජනතාවගේ අභිවෘද්ධියත් රජුගේම වගකිම ලෙස පිළිගනි. නීතිය හා සාමය පිළිබඳ වගකීම්ද ඔහු පිටම පැවරිණි. තවද මහ ජනයාට ඇතිවන දූර්භාග්‍යයන්ට පමණක් නො ස්භාවධර්මයන්ගේ සිද්ධීන් පිළිබඳව ද වගකිව යුත්තා ඔහුම විය.

රජුට සිය අධිකාරි බලය පවරන ලද්දේ සංඝයා විසින්යැයි යනුවෙන් ඉදිරිපත් කරුණු හිමිකම් නිසා දේශපාලන අධිකාරී බලයට ආගමික අනුමැතිය ද එකතු විය. අභයගිරි විහාර අභිලේඛනයෙහි මෙසේ සඳහන් වී ඇත. දිවයිනේ පාලකයෝ මහා සංඝයා විසින් තම පාත්‍ර හා සිවුරු ආරක්‍ෂා කරවා ගැනීම සඳහා පිරිනමන ලද රාජ්‍යත්වයට පත්වීමෙන් පසු අභිෂේක මංගල උත්සවය පවත්වන දිනයේදී ම මහා සංඝයාට මෙහෙය කිරීම සඳහා සුදු හිස් වෙළුම ලා ගැනීමට පුරුදුව සිටියහ. මේ ප්‍රකාශයෙන් කරුණු දෙකක් ඉස්මතු වේ. පළමුව රාජ්‍යත්වය සංඝයා විසින් පිරිනමන ලද්දක් ලෙස සලකන ලද බවයි. වංසත්ථප්පකාසිනියෙහි විස්තර කොට ඇති රාජාභිෂේක උත්සවය පැහැදිලි වශයෙන් ම බෞද්ධ වූ ස්වරූපයකින් ම යුතු විය. මේ උත්සව සඳහා භාවිත කරන ලද භාජන තනන ලද්දේ තත් පොළොවෙන් ගෙනෙන ලද මැටිවලිනි. ඉන් පස් පොළක්ම බෞද්ධාගමික වැදගත් කමකින් යුත් ස්ථාන විය (මෙන්දිස්, 2550: 751).

රාජ්‍යත්වය සංඝයා විසින් පිරිනමන ලද නිලයක් ලෙස සලකනු ලැබේ. සංකල්පය රජුගේ බලය හීන කරලීමේ සාධකයක් ද විය. ඒ වනාහි රජු සංඝයා මත රඳපවත්නා පුද්ගලයෙකු බවට පත් කිරීම නිසාය. දකුණු ආසියාවේ පශ්චාත් කාලීන බෞද්ධ රජවරුන් සමඟ සන්සන්දනය කරන කළ ලංකික රජවරුන් තමන් රට පාලනය කිරීමේ



ස්භාවික අයිතියක් හිමිව සිටි නැවත උපන් බෞද්ධ දෙවියන් හෝ බවට හිමිකම් ඉදිරිපත් නොකිරීම අපූර්ව දෙයක් සේ පෙනේ. න්‍යායික වශයෙන් රජකමේ බලය සහ තත්වය සංඝයාත් රජුත් එකඟ වීම මත රඳා පැවති බැව් පෙනේ. එසේ වුවත් සංඝයාගේ තත්ත්වය රජුගේ තත්ත්වය අභිබවා යෑමට සමත් නොවීම ඉතා වැදගත් කරුණකි. එක් තනි නායකයෙකු නොසිටීමත් සංඝසමාජයේ තරඟකාරී කට්ටි තුනක් බෙදී තිබීමත් එහි අධිකාරී බලය හීන වීමට හේතු සාධක විය. භික්‍ෂූන්ගේ ජීවිත හැසිරවීමෙහිලා බලපෑ විනය නීති මගින් භික්‍ෂූන් දේශපාලන අධිකාරි බලය කෙළින්ම අතට ගැනීමෙන් වළක්වනු ලැබිණි. මේ නීතිය නොතකා හැරීමට භික්‍ෂූන් තීරණය කළත් ශාසනයේ ආරක්‍ෂාව වශයෙන් ඒවා බලෙන් ක්‍රියාත්මක කිරීමට රජුට පුළුවන් විය. තවද විහාරස්ථානවලට අයත් දේපල රාජසන්තක කිරීමේ හා වරටප්‍රසාද අවලංගු කිරීමේ හැකියාව සංඝයා රජුට විරුද්ධව ප්‍රසිද්ධියේ අභියෝග කිරීම වළක්වාලූ සාධකයක් වන්නට ඇතැයි අදහස් කළ හැකිය. මේ ආදී කරුණු නිසා සංඝයාට රාජ්‍ය කටයුතු තමන්ට රුචි පරිදි මෙහෙයවීම සඳහා අධිකාරී බලයක් ලබා ගත හැකි එකම මාර්ගය වූයේ තම නියෝජිතයන් සිහසුනට පත් කිරීමයි (මෙන්දිස්, 2550: 751).

රාජ්‍යත්වය අපේක්‍ෂා කරන රජු විසින් මනා අධ්‍යාපනයක්ද ප්‍රගුණ කොට තිබිය යුතුය. ඉන්දියාවේ නම් මනුස්මෘතිය හා කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය මැනවින් ප්‍රගුණ කළ යුතු වේ (පඤ්ඤාකිත්ති හිමි, 2003: 40-41). රාජ්‍ය පරම්පරාව ගැන කතා කිරීමේ දී රාජ උරුමය පිළිබඳ නෛතික තත්ත්වයද රාජ්‍යත්වය සම්බන්ධයෙන් වැදගත් වේ. බල ලෝභිත්වය පදනම් කරගෙන රාජ්‍ය පැහැර ගැනීම් සිදු වූ බව දක්නට ලැබේ. සාමාන්‍යයෙන් පැරණි ලංකාවේ රජකම පියපුතු උරුමය හා වැඩිමහලුකම අනුව ද පරම්පරාගතව පැවත ආ බව පෙනේ. රාජ්‍ය පාලකයන් සමඟ කටයුතු කිරීමේදී භික්ෂූන් වහන්සේ ක්‍රියා කර ඇත්තේ ද ඉතාම සංයමයෙන් හා සාධාරණීය පරිද්දෙනි. ද්‍රවිඩයන් සමග යුද්ධයේදී විනාශ වූ ජීවිත සම්බන්ධයෙන් ලක්දිව දුටුගැමුණු රජතුමාට පශ්චාත්තාපයක් ඇති වූ අවස්ථාවේ මහාවිහාරයීය සම්‍යග් ප්‍රයෝගයකින් මැරුණු සංඛ්‍යාව මිනිසුන් එකහමාරක් පමණයැයි පවසා තිබේ එය හුදෙක් සාසන සංග්‍රාහක රජතුමා අස්වසනු පිණිසය (විපස්සි හිමි, 2005: 15). මෙම කතා පුවත්වලින් රජුත් සාසනික භික්ෂුවත් අතර පැවැති සම්බන්ධය මැනවින් පිළිබිඹු වේ.

අනුරාධපුර රාජධානියේ පාලන කටයුතු කළ දේවානම්පිය තිස්ස, උත්තිය, දුට්ඨගාමිණී, සද්ධාතිස්ස, ලඤ්ජතිස්ස, (ක්‍රි:ව: 119 - 110) වට්ටගාමිණී, (ක්‍රි:පූ: 89- 77) මහාචූලික මහාතිස්ස, තිස්ස (ක්‍රි:පූ: 50 - 47) කූටකණ්ණ තිස්ස, හා අමණ්ඩගාමිණී අභය (ක්‍රි:ව: 22 -31) වැනි පාලකයන්ද 'දෙවනපිය' විරුදය භාවිත කෙරුණු බව අභිලේඛන සාක්ෂිවලින් හෙළි වේ. මුල් අනුරාධපුර පාලක පිරිස් විසින් යොදා ගත් මෙම විරුදය රාජ්‍යය සංවිධානය බිහිවීමෙන් රෝහණ පරපුරෙන් පැවතෙන පාලකයන්ද භාවිත කළ බවක් පෙනේ. ක්‍රි:පූ තෙවැනි සියවසේ දී පාලක විරුදයක් ලෙසින් 'දෙවනපිය' යොදා ගත්තද ක්‍රි:ව: පළමුවැනි සියවසින් පසු අනුරාධපුර පාලක පවුලට සම්බන්ධ වූවෙක් ය යන්න හැඳින්වීම සඳහා ද 'දෙවනපිය' යන්න භාවිත කරන්නට ඇතැයි ඉහත සඳහන් කළ අභිලේඛන සාක්ෂිවලට අනුව අනුමාන කළ හැකි ය. එසේම පාලකයන්ගේ බලය හා ආධිපත්‍යය මතු කිරීමේ අවශ්‍යතාවය මත මෙම විරුදයෙන් හඳුන්වා ගන්නට ඇතැයි ද සිතීමට ඉඩ තිබේ **(විමලවංශ හිමි, 2016: 80-81).**

මුලින් ම ආගම හා දේශපාලනය ඈඳී ගිය අවස්ථාවක් අපට හමුවන්නේ දුටුගැමුණු යුගයේ ය. එද ආගමික කරුණක් යුද්ධයේ දී ඈඳ ගත්තේ දේශපාලන කපටිකම් වශයෙනැයි සිතිය නොහැක. දුටුගැමුණුගේ ආගමික භක්තියත් එද මේ රටේ සිටි ආගමික ශ්‍රද්ධාවෙන් වෙලිගිය වැසියන් ගැනත් සලකන විට ඒ යුද්ධයට ආගමික සටන් පාඨයක් යොදගත්තේ මක්නිසාදැයි සිතාගැනීමට අපහසු නොවේ. "මාගේ ව්‍යායාමය තෙමේ කිසිකලකත් රජසැප පිණිස නොවේ බුද්ධ ශාසනයාගේ දියුණුව පිණිසයි" යන මේ වැකිය එද විජිතපුර ආක්‍රමණය තෙක් ගෙනගිය සටන් පාඨය නොවේ. එද භාවිත කළේ මේ අදසහ ඇති වැකියක් විය හැක. මෙය එද යුද්ධ භූමියෙහි ජයග්‍රාහක සටන් පාඨය විය. පැරණි සිංහලයන්ගේ ජීවිතයෙන් ආගම ඈත් නොවූ නිසා එය ඔවුන්ගේ අවංක හැඟීම විය හැකිය. ඒ ජයග්‍රහණයෙන් පසු ගැමුණු කළ කී දෙයින් ගැඟෙන්නේ රජකම තකා මෙය ඉදිරිපත් කළ බව නොවේ මහාවංසය, ථූපවංසය වැනි ග්‍රන්ථවල සඳහන් ගැමුණු චරිතයෙන් නම් එබන්දක් හැඟී නොයයි. රජකම ලබාගත් පසු ඔහුගේ කාලයෙන් වැඩිහරියක් ගත කළේ දගැබ් විහාරාරාම කරවීම පිණිසය **(විමලවංශ හිමි, 2016: 80-81).**



බුදුදහමේ ආභාසයෙන් තම පාලන තන්ත්‍රය සකස් කරගත් අශෝක රජු පවා සත්වහිංසනය සහ වැරදි කළවුන්ට අභයදානය ලබාදී සිදු කොට තිබේ. එපරිද්දෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් ද රජු නිරායාෂයෙන් ම ඉවසීමේ ගුණය සහ කරුණා ගුණය ප්‍රගුණ කළ බව දැකගත හැකි වේ. "රටේ ජනතාවගේ අභිවෘද්ධිය ගැන සිතු රජවරුන් තම රටවැසියා විසින් කරන ලද වැරදිවලට සමාව දෙමින් සහ ඔවුගේ ජීවිත ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතභාවය තහවුරු කරමින් තම පාලන රටාව ප්‍රජාතන්ත්‍රවාදීව මෙහෙය වීමට උත්සුක වී ඇති බව පොනේ **(දිවාකර, 2015: 56).**

අනුරාධපුර යුගයේ පාලන තන්ත්‍රය රැගෙන ගිය තවත් පාලකයෙක් ලෙස වළගම්බා රජු හඳුනාගත හැකිය. ඔහුට විරුද්ධව රුහුණේ සිටි එක්තරා බ්‍රාහ්මණ වංශික තරුණයෙකු පූජකයෙකුගේ උපදෙස් පරිදි වලගම්බා රජුට විරුද්ධව කැරලි ගැසීම මේ අතර ප්‍රධාන වේ. වළගම්බා රජු රාජ්‍ය අතහැර පලායන විට වැඩිපුර උද්දමයට පත් වූයේ ගිරිනම් නිඝණ්ඨයා බව වංසකතා සඳහන් කරනු ලබයි. ඒ අනුව පෙනීයන්නේ අබෞද්ධ පාලකයින් පවා තම ආගමික නායකයන්ගෙන් රාජ්‍ය පාලනයට අවශ්‍ය උපදෙස් ලබාගෙන ක්‍රියා කොට ඇති බවය. එමෙන් ම වළගම්බා රජු පරාජයට පත් වී සිටි අවස්ථාවේ රජුට සහය වූ කුපික්කලතිස්ස තෙරුන්වහන්සේ වෙනුවෙන් අභයගිරි ආරාමය සකස් කර පූජා කිරීම හා රාජ්‍ය පවත්වාගෙන යෑමට උපදෙස් ලබා ගැනීම කැපීපෙනෙන ලක්ෂණයන් වේ **(කුලතුංග, 2014: 20).** රාජ්‍ය සංවිධාන බිහිවීමෙන් පසු අනුරාධපුර පාලකයාගේ බලය හා අධිකාරිත්වය අනුරාධපුරයෙන් ඈත පිහිටි ප්‍රදේශවලට ගෙනයෑමේ කාර්යයන් විධිමත්ව හා විමධ්‍යගත ආකාරයට එම ප්‍රාදේශීය නායකයන් අතින් ඉටු වූ බවත් ය. මේ බව ගම්‍යමාන වන්නේ එකළ විසූ ඇමතිවරුන් ස්ථාපනය කරන ලද අභිලේඛනවලිනි. රාජ්‍යත්වය හා බැඳුණු තවත් චාරිත්‍රයක් වන්නේ අභිෂේකයයි. රජු රාජ්‍යත්වයේ තුළ නීත්‍යනුකූලත්වයට පත් වන්නේ අභිෂේකයෙන් පසුවය. එය ඉතා උත්සවාකාරයෙන් භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් පරිදි සිදු වී ඇති බව දක්නට ලැබේ.

අනුරාධපුර යුගය තුල මෙන් ම අනෙක් යුගවල ද බුදුදහමේ ආභාෂය රාජ්‍ය පාලනය සඳහා කෙතරම් දුරට බල පෑවේ ද යන්න එවකට භාවිත මුදල් තුලින් ද මනාව පිළිබිඹු වේ. විශේෂයෙන් මුදල්

නිෂ්පාදනය කිරීමේ දී බෞද්ධාගමික සංකේත බහුලව යොදගෙන ඇති බව දැකගත හැකිවේ. "වමට ඇවිදින අලියා දකුණට කරකැවෙන රාමු ස්වස්තිකය (Railed Svastika) එක් එක් ශාඛාව උල් තුනකින් සැදුණු ශාඛා තුනකින් යුත් තුළ සහ කොටස් තුනකින් සැදුණු ස්තූපයක්. රාමු ස්වස්තිකය, චෛත්‍යය, එකට ස්පර්ශ වූ ත්‍රිකෝණ දෙකක්, කොටස් තුනකින් සැදුණු ස්තූපයක් සහ ත්‍රිශූලයකින් යුක්තය. මෙම රාමු ස්වස්තිකය බෞද්ධයන්ගේ පූජනීය සළකුණක් සේ සැළකේ. ස්වස්තිකය හා අනෙක් සලකුණු පිළිබඳව හෙට්ටිආරච්චි මෙසේ පැහැදිලි කිරීමක් කර තිබේ. මෙම එසවුණු රාමු ස්වස්තිකයේ සියළු ම කොටස් එකතුවගත් කළ මෙම සලකුණ බුදුන්වහසේ හිදි ඉරියව්වකින් දම්සක් පැවැත්ම දක්වන මනුෂ්‍යාරෝපිත නොවන නිරූපණයක් ලෙස ගැනීම ගැන අප තවදුරටත් වැරදිවිය නොහැකිය. (උද - ධර්ම චක්‍ර මුද්‍රාව) ඔහු තවදුරටත් දක්වන්නේ බුදුන් වහනසේගේ රුව කළා කෘති මගින් දැක්වීමක් නොපැවතුණු අවධියේ යොදගත් දේශීය විශිෂ්ට සමරු ආදේශකයක් ලෙස මෙය ගත හැකි බවයි (රත්නසේකර, 2018: 24). කාසියේ දැකවෙන අනෙක් සලකුණු ද සැලකිල්ලට ගැනීමෙන් ඔහු වඩාත් විස්තාරත්මක අදහසක් ඉදිරිපත් කර ඇත. එනම් පුරාණ ලක්දිව බුදුදහම ප්‍රචාරය කළ අය විසින් එම කටයුතු සඳහා කාසියේ ලාංඡනය යොද ගත් බවට අනුමාන කළ හැකි බවයි. මේ උපකල්පනය මීට ඉහත දී මෙම කාසිවල ඇති සලකුණු ගැන ජෝන් ස්ටිල් සඳහන් කර ඇති විස්තරය හා සසඳා බැලීම වටී එහි ඔහු මෙසේ සඳහන් කරයි. "සියලුම සංකේත බෞද්ධ ඒවා වේ. මෙසේ කිවහැකිවන්නේ මෙම එක් එක් සලකුණු බුද්ධාගම පිළිබඳ හැඟවීමක් ලබාදෙන බැවිනි. එමෙන් ම මෙම කාසිවල සංකේතාත්මකව බුදුදහම පිළිබිඹුවන බැවින් ඒවා නිපද වන්නේ කවුරුන් ද යන්න ගැන රජතුමාට ගැටලුවක් නොවීය (රත්නසේකර, 2018: 24). මෙම අදහසෙන් ගම්‍යමාන වන්නේ බුදුදහම සහ රාජ්‍ය පාලනය යනු එකම කාසියේ දෙපැත්ත බඳුය.

ඉහත සඳහන් තොරතුරු සාකච්ඡා කිරීමේදී අපට පෙනීයන්නේ දේශපාලනික ක්ෂේත්‍රයට බෞද්ධාගමික බලපෑම් කොතරම් දුරට බලපෑවාද යන්නයි. රාජ්‍යත්වයට පත්වන රාජ්‍ය නායකයා බෞද්ධයෙකු වීම අනිවාර්ය කාරණාවක් වූ අතර සෑම විට ම රජුගේ අනුශාසකයා වූයේ භික්ෂූන් වහන්සේලාය. මුල් කාලයේදී විශේෂයෙන් අනුරාධපුර දෙවන පෑ තිස් රාජ්‍ය සමයේ මිහිඳු හිමියන් මෙරටට බුදු දහම



හඳුන්වාදීමත් සමඟ එම බෞද්ධ සම්ප්‍රදායට අනුවම රාජ්‍ය පරිපාලන ක්‍රියා පටිපාටිය නිර්මාණය වන්නට විය. ඒ අනුව පණ්ඩුකාභය රජු ආරම්භ කළ අනුරධපුර රාජධානිය තුළ ඉන් පසුව රාජ්‍යයත්වයට පත් වූ කාවන්තිස්ස, දුටුගැමුණු, සද්ධාතිස්ස, වළගම්බා, ඉළනාග, වසභ, වෝහාරික තිස්ස, සිරිසඟබෝ, මහසෙන්, ධාතුසේන, පළමුවන දෙවන අග්බෝ, මානවම්ම, දෙවැනි මහින්ද ආදි රජවරුන් ද බොහොසෙයින් ඉහත සඳහන් කළ බෞද්ධාගමික චාරිත්‍ර ධර්මයන් ඉටු කරමින් තම පාලන කටයුතු ගෙනගිය ආකාරයක් දක්නට ලැබේ.

**සමාලෝචනය.**

ඉහත සඳහන් කළ කරුණුවලට අනුව අප මෙහි දී අධ්‍යයනය කරන්නට යෙදුනේ අනුරාධපුර යුගය තුළ දේශපාලන ක්ෂේත්‍රයට බෞද්ධාගමික බලපෑම් කුමන ආකාරයට බලපෑවේ දයන්නේ ය.ශ්‍රී ලංකාවේ බුදුසමයේ ඉතිහාසය යම් තරම් පැරණි ද ඒ තරමට ම බුදුසමයත් රාජ්‍යයත් අතර සම්බන්ධය පැරණිය. ලංකාවේ බුදුසමයෙහි ඉතිහාසය ක්‍රි:පූ: 03 වන සියවසෙහි දේවානම්පිය තිස්ස රජු දවස දක්වා දිවයයි. බුදුසමයත් රාජ්‍යයත් අතර සම්බන්ධය ද ඒ දක්වාම පැරණි ය.ලක් සිහසුන බෞද්ධයෙකුට මිස අන් කිසිවෙකුටත් හිමි නොවන බව මේ මුළු කාලයේම ලක්වැසියන්ගේ සම්මතය විය. ක්‍රි:ව: 10 වන සියවස වන විට මේ අදහස තවදුරටත් වැඩි දියුණු වී ගොස් බෞද්ධයෙකු පමණක් නොව ලක් රජ උරුමය බෝධිසත්වවරයෙකුටය යන අදහසක් ඇති විය. ලංකා රාජ්‍යය හා බුදුදහම අතර කොපමණ සම්බන්ධයක් තිබුණාදැයි ඔවුන් ලබා සිටි සංඥා නාමයන්ගෙන් පැහැදිලි වේ. බුද්ධදාස, සංඝතිස්ස, සංඝබෝධි, සද්ධාතිස්ස, ධාතුසේන, අග්ගබෝධි ආදි නම් ඒ සඳහා නිදසුන් ය. භික්ෂූන් වහන්සේ රාජ්‍ය උරුමය පිළිබඳව ද මැදිහත් වූ බවක් දක්නට ලැබේ. ඇතැම් විට තමන්ට අභිමත වූවන් රාජ්‍ය පාලනයට පත් කිරීම සඳහාත් පැන නැඟ ඇති ව්‍යාකූලතාවන් මඟ හැරවීම සඳහාත් මේ මැදිහත් වීම සිදු වී තිබේ. එම කටයුත්ත රාජ්‍ය ආරම්භයේදී ම මෙන්ම අවසානය දක්වා ම නො අඩුව සිදු වූ බව ඓතිහාසික තොරතුරු විමර්ශනය කිරීමේ දී මනාව විශද වේ. හැම අවස්ථාවේ ම රජුගේ අනුශාසකයා බවට පත් වූයේ භික්ෂූන් වහන්සේ ය. එහිදී රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් බොහෝ උපදෙස් ලබා දී ඇති බව දක්නට ලැබේ.රාජ්‍ය නීති රීති

සම්පාදනයේදී ද බුදුදහමෙහි බලපෑම් බොහෝ සෙයින් දක්නට ලැබේ. මේ ආකාරයට කරුණු විමසා බැලීමේ දී රජෙකු පත් කර ගැනීමේ සිට සියලු ම රාජ්‍යතාන්ත්‍රික කටයුතු සඳහා බුදුදහමේ ආභාසය මෙන් ම බෞද්ධාගමික බලපෑම සිදු වූ බව අවිවාදයෙන් යුතුව පිළිගත යුත්තකි. ඒ අනුව රාජ්‍යයත් බුදුදහමත් එකටම ගමන් කරන අන්ත දෙකක් බව පැහැදිලි ය. මේ අනුව සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය හුදෙක් ජනතාව හමුවේ පාලන කාර්යයක් පමණක් නොවීය. එය බුදුදහම ආරක්‍ෂා කරමින් සංවර්ධනය කරමින් ජනතාව ඊට අදාළ ගුණ ධර්ම ඇති කරමින්, පාලනයට බුදුසමයත් බුදුසමයට පාලනයත් යන සංකල්පය මත ගොඩනැඟෙන්නට විය. ඒ අනුව සමස්ථ කරුණු සම්පිණ්ඩය කර බැලීමේ දී දේශපාලන ක්‍ෂේත්‍රයට ඍජුවම බෞද්ධාගමික බලපෑම තිබූ බව මෙම කරුණුවලින් අනාවරණය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


වංසත්ථප්පකාසිනි, (2001). අමරවංස හිමි, අකුරටියේ, (සංස්). වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

ඉන්දිකා දිවාකර, අනුරින්, (2015). **සෙල්ලිපි සන්නස්වලින් හෙළිවන ලංකාවේ සමාජය.** මරදන: සමයවර්ධන මුද්‍රණශිල්පියෝ.

කරුණාරත්න, සද්ධාමංගල, (2000). **ශිලා ලේඛන සංග්‍රහය.** (පරි) කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

කුලතුංග, ටී.ජී, (2014). **පුරාණ අභයගිරි විහාරය,** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

චන්දසිරි හිමි, ලියනේගම. (2007). **ලක්දිව අභිෂේක මංගල්‍යය.** වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

ඤාණවිමල හිමි, බෙල්ලන. (2000). **අශෝක ශිලාලේඛන.** මරදාන: සමයවර්ධන පොත්හල.

**දීඝනිකාය 03.** බු.ජ.ත්‍රි, (2005). නැදිමාල, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පඤ්ඤකිත්ති හිමි හිරිපිටියේ. (2003). **කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය.** වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

බුද්ධදත්ත හිමි පොල්වත්තේ. (1998). **පාලි සිංහල අකාරාදිය.** බොරලැස්ගමුව: අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්.





**මහාවංසය.** (1984). පිටකෝට්ටේ, කෝට්ටේ: රත්න මොඩන් ස්ටූඩියෝ.

මෙන්දිස්, ජී. සී. (2550). **සම්භාෂා.** කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

විපස්සි හිමි, රඹුක්වැල්ලේ, (2005). **සමන්තපාසාදිකා විනයට්ඨ කතා,**කොළඹ: සමයවර්ධන මුද්‍රණාලය.

ලගමුව, ආරිය. (2009). **මිහින්තලේ සෙල් ලිපි.** IRQUE - QUEF, වැඩසටහනේ අනුග්‍රහයෙන් මුද්‍රාපිතයි.

ලලිත රත්නසේකර, නිමල්. (2018). ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ක්‍රමයේ ඉතිහාසය. බොරලැස්ගමුව: ඩිසයින් වේව්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

ලියනගේ, සිරි. (2014). **බෞද්ධ සිංහල ශබ්දකෝෂය.** මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

සූරවීර, ඒ.වී. (2010). **අනුරාධපුර සංස්කෘතිය.** වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

සෝරත හිමි, වැලිවිටියේ. (1999). **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.**වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.

Wijesinghe. Sri Suddharman D Zylva. (1999). **English – Snihala Dictionary**. Colombo: M.D. Gunasena and Co. Ltd.

**The prehistory and photohistory of sri lanka** in the art and archaeology of sri lanka, (2017) premathilake p.l.s.& bandaranayaka, deraniyagala s.u., Colombo: silva central cultural.


ශ්‍රී ලංකා භික්ෂු
30 OCT 2023
පුස්තකාලය